# අපේ පිනට මෙහි සැපත් වූ හාමුදුරුවෝ



''චරත භික්කවේ චාරිකං බහු ජන හිතාය බහු ජන සුඛාය'' - බුදුන් වහන්සේ තම සව්වන්ට කියා ඇතැයි කියන මේ අවවාදයේ තේරුම නම්, බොහෝදෙනා ගේ හිත සුව පිණිස මඟට බසින්න' යනුයි.

බටහිර ඕස්ට්‍රේලියාවේ පර්ත් :ඡැරඑය* නුවර සිරි ලංකාරාමයේ වැඩ වසන බේරුවල සිරි සෝභිත හාමුදුරුවන් දකින විට මට සිහිපත් වන්නේ ඒ උතුම් බුදු වදන්ය. තම අදිපතියාවෙන් පැති වෙහෙර විහාරවල අය්තියත්, ගුරුවරයකු වශයෙන් ලත් වැටුමත් ගැන නොතකා ඕස්ට්‍රේලියාව වැනි දුරු රටක වෙසෙන බුදුනුවන්ගේ යහපත සඳහා තමන්ට කළ හැකි යම් ම කිසි සේවාවක් වෙතොත් එය සපුරා ලන මහගු සිතිවිල්ල ම පෙරදැරි කරගෙන මෙහි පැමින නිස්සරනාද්‍යාශයෙන් පරාර්ත චර්යාවේ යෙදෙන උන්වහන්සේ ගැන කතා බහ කරන විට මෙහි බුදුනුවන් පවසන්නේ ''ඒ හාමුදුරුවෝ අපේ පිනට මෙහි පැමිනි කෙනෙක්'' යනුවෙනි.

බේරුවල විලියම් මානවඩුගේ සහ ප්‍රේමවතී ඇලබඩ ලියනගේ දෙමාපියන්ගේ පැතුම් පල ගන්වමින් සිංහල අවුරුදු කුමරුන්ට මඟ සරසමින් 1957 අප්‍රේල් 13 වැනි දා මෙලෝ එළිය දුටු තම පුතා සුපේශල ශික්ෂාකාමී බුද්ධ පුත්‍රයකු වෙතැයි එදා ඒ මාපියන් නොසිතුවා විය හැකිය.

දස බලධාරී, දස පාරමී දම්, දස කුසල්, දස මහ යෝදයන් නිසා 'දහය' පසිඳු ය. සත් සතිය, සත් කුල පව්, සත් සර, හද්දා වැස්ස නිසා ''හත'' ද පසිඳු ය. දරුවන් ''දස'' දෙනෙකු අතරින් ''හත්'' වැනි තැන ලත් ඒ පින්වත් දරුවා කුඩා අවදියේ සිට ම බනට දහමට නැඹුරු වුයේ කිසියම් වාසනා ගුනයක් නිසා යැයි කීම නිවැරදි යයි සිතමි.

අපට බන දහම් කියා දෙමින් අද මෙහි වැඩ වසන බේරුවල සිරි සෝභිත යතිවරයා නම් එදා අවුරුදු කුමරාට පෙර මඟ සදමින් මෙලෝ එළිය දුටු ඒ පින්වත් හත්වැන්නා ය.

බේරුවල අබිනවාරාම විහාරාධිපතිව වැඩ විසූ කෝට්ටගොඩ සිරි සුමේද ලොකු හාමුදුරුවන්ගේ හා කලුතර සිරි දම්ම ලොකු හාමුදුරුවන්ගේ ආචාර්යත්වයෙන් හා අග්ග මහා පන්ඩිත බේරුවල සිරිනිවාස ලොකු හාමුදුරුවන්ගේ උපාද්‍යායත්වයෙන් 1968 අප්‍රියෙල් 14 වැනි දා අවුරුදු බත වැලදීම සඳහා පැවිදි බිමට බට මුන් වහන්සේ ගිහි දිවිය ගත කලේ හරියටම එකොලොස් වසකි.

1980 දී උපසම්පදා සීලයට පත් වූ මුන් වහන්සේ කොලඹ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාදිය ලත් තැනැත්තෝ, අහුංගල්ලේ ඥානතිලක පිරිවෙනින් තම ගුරු ජීවිතය ද ආරම්බ කලහ.

පර්ත් (Perth) නුවර බෞද්ධ සංගමයෙන් ලත් ආරාදනයක් අනුව තම මව්බිමටත් හිතවතුන්ටත් ආයුබෝවන් කී උන් වහන්සේ ක්‍රි.ව. 2000 සැප්. 21 වැනි දා බටහිර ඕස්ට්‍රේලියාවේ පර්ත් නුවරට සැපත් වූහ.

කෙන්වික්හි ''ඔස්ටින් ඇවිනියේ'' ශ්‍රී ලංකාරාමයේ වැඩ වසන උන්වහන්සේගෙන් මහගු සසුන් මෙහෙවර බටහිර ඕස්ටෙලියාවේ බුදුනු නුබුදුනු බොහෝ දෙනාගේ ප්‍රසාදයට හේතු වී ඇත.

සිරි ලංකාවේ ගමේ පන්සලක සිරියාවත් අපේ සිංහල කමත් රැකී ඇති එම පන්සල මිනිස් දිවියේ සැබෑ අරුත විදහා පාන තැනක් බව ඒ පින් බිමට ඇතුල් වන කවර කෙනකුට උවද අවබෝද වේ.

සිරි සෝබිත හිමියන් අතින් සිදුවන ලෝ සසුන් මෙහෙවර අගය කල අමරපුර මහා නිකායේ මහා නායක අතිගරු අම්බලංගොඩ සිරි සුමංගල හිමිපානන් වහන්සේ ප්‍රමුඛ කාරක සංඝ සභාව, ඕස්ට්‍රේලියාවේ ප්‍රදාන සංඝනායක පදවිය උන්වහන්සේට පිරිනැමීමට තීරණය කරන ලද්දේ එහෙයිනි.

ඒ පිළිබඳ අක්ත පත්‍ර ප්‍රදානය 2007.05.26 වැනිදා සැනිදා බේරුවල අබිනවාරාම විහාරයේදී අතිඋත්කර්ෂවත් අන්දමින් සිදු කරන ලදි.

ලෝ සසුන් මෙහෙවර නොකඩවා කර ගෙන යනු වස් උන්වහන්සේට අපි දිගාසිරි පතමු.

*''හත්ථසඤ්ඤදතෝ පාදසඤ්ඤදතෝ*
*වාචායසඤ්ඤදතෝ සඤ්ඤදතුත්තමෝ*
*අජ්ඣත්තරතෝ සමාහිතෝ*
*ඒකෝ සන්තුසිතෝ තමාහු භික්ඛූ*

**වි.ක. ධර්මබන්දු**
බටහිර ඕස්ට්‍රේලියාව

තිසර FM 97.4
FM 97.4
සෙනසුරාදා පව 1 සිට 5 දක්වා
ඔබට පිදෙන සාර සංග්‍රහය

නැවුම් පුවත් හරවත් කතා බහ
දෙස් විදෙස් කාලීන සිද්ධීන් මියුරු සංගීතය
ලක් හඬ FM 97
සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා
ඔබේ හඬ - ලක් හඬ

රංජිත් රූබි සමඟ පැය තුනක්
විනෝදය සහ
නැවුම් ගීත සමගින්
සෑම ඉරිදාවකම
රාත්‍රී 8 ට හමුවෙමු
Voice of Lanka
97.7FM 3SER

